(14)

දෙපාර්තමේන්තු වක්‍රලේඛ අංක: 06/2011

මගේ අංකය:- DAPH//LR/1/3/1
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
පේරාදෙණිය.
2011.11.22.

සියලුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල
පළාත් අධ්‍යක්ෂකවරු මහින්
දිස්ත්‍රික් පශු වෛද්‍ය නිලධාරීන්
සියලුම පශු වෛද්‍ය නිලධාරීන්

1958 අංක: 29 දරණ සත්ත්ව පනත ක්‍රියාත්මක කිරීම

1958 අංක 29 දරණ සත්ත්ව පනත ක්‍රියාත්මක කිරීමේ වගකීම නීත්‍යානුකූලව පැවරී ඇත්තේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට වන අතර එම පනත ක්‍රියාත්මක කිරීමේ බලධරයා වන්නේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වරයාය.

මෙම පනත ක්‍රියාත්මක කිරීමේ මූලික අදියර මෙන්ම වැදගත්ම ආරම්භක කරුණ වන්නේ සම්මත ප්‍රමිති වලට අනුකූලව සතුන් හඳුනාගැනීමට කටයුතු කිරීමයි.

අදාල සත්ත්ව පනත යටතේ 2009-11-26 දිනැති 1629/17 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද රෙගුලාසි වලින් මෙම කරුණ ආවරණය වී ඇති අතර, මෙම රාජකාරිය ඉටුකිරීම, පශු සම්පත් ක්ෂේත්‍රයේ ප්‍රධාන ප්‍රාදේශීය තාක්ෂණික නියමුවන් වශයෙන් කටයුතු කරන රජයේ පශු වෛද්‍ය නිලධාරීන්ගේද රජයේ පශු වෛද්‍ය කාර්යාල වල සේවය කරනා සියලුම ක්ෂේත්‍ර නිලධාරීන්ගේද ප්‍රධානම වගකීමක් වේ.

විධිමත් සතුන් හඳුනා ගැනීමේ ක්‍රමයක් අනුගමනය කිරීම සත්ත්ව අභිජනන, සත්ත්ව සෞඛ්‍ය, පශු වෛද්‍ය මහජන සෞඛ්‍ය සේවා කටයුතු සඳහා මෙන්ම, පශු සම්පත් ක්ෂේත්‍රයේ සියලුම ඉදිරි සංවර්ධන කටයුතු දියත් කිරීම සඳහාත්, සතුන් ප්‍රවාහනය කිරීමටත්, ඉදිරියේ ඇතිවිය හැකි ආපදා සහ මහජන සෞඛ්‍යයට අහිතකර අවදානම් තත්ත්වයන්හිදී නීත්‍යානුකූල කටයුතු සඳහාත්, සතුන් සොරකම් කිරීම මැඩලීම යනාදී, සියලු නීතිමය කටයුතු සඳහාත් අත්‍යාවශ්‍ය මූලිකම කරුණකි.

ඵලෙස සතුන් හඳුනාගැනීම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මේ වනවිටත් සියලුම පළාත් අධ්‍යක්ෂ වරුන්, පශුවෛද්‍ය නිලධාරීන් සහ ක්ෂේත්‍ර නිලධාරීන්ද දැනුවත් කර ඇති අතර සතුන් හඳුනා ගැනීමට අවශ්‍ය උපකරණ, මෙවලම් සහ අදාල ලේඛණ මේ වන විටත් ලබා දී ඇත.

එබැවින් රේඛීය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, සියලුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු, සහ ඒ යටතේ ක්‍රියාත්මක වන සියලුම ක්ෂේත්‍ර සහ ප්‍රාදේශීය කාර්යාල සහ සියලුම ආයතන, වහාම ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් උපදෙස් අනුව කටයුතු කළ යුතුවේ.

1) යම් පශු වෛද්‍ය නිලධාරියෙකු විසින් ඕනෑම රාජකාරිමය කටයුත්තක් සඳහා, ඕනෑම මිගව හෝ එළගව ගොවිපොලකට යන්නේ නම්, අදාල ගොවිපොල දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබීම සහ එම ගොවිපොල සතු සියලුම මී ගවයන් සහ එළ ගවයන්ගේ කන් සලකුණු කර තිබීම අත්‍යාවශ්‍ය වේ. එලෙස කටයුතු කෙරී නොමැති ගොවිපොලක් නම් ආරම්භයේදීම අදාළ ගොවිපොල දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමටත් එම ගොවිපොල සතු සියලුම මී ගවයන් සහ එළ ගවයන්ගේ කන් සලකුණු කිරීමටත් කටයුතු කලයුතු වේ.

2) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (රේඛීය සහ පළාත්) යටතේ ක්‍රියාත්මක වන හෝ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ වෙනත් ආයතනයක් මගින් ක්‍රියාත්මක වන සියලුම එළගව සහ මීගව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ද, අදාල ගොවිපොල දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබීම සහ එම ගොවිපොල සතු සියලුම මී ගවයන් සහ එළ ගවයන්ගේ කන් සලකුණු කර තිබීම අත්‍යාවශ්‍ය වේ. එලෙස කටයුතු කෙරී නොමැති ගොවිපොලක් නම් ආරම්භයේදීම අදාල ගොවිපොල දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමටත් එම ගොවිපොල සතු සියලුම මී ගවයන් සහ එළ ගවයන්ගේ කන් සලකුණු කිරීමටත් කටයුතු කලයුතු වේ.

3) රජයේ පශු වෛද්‍ය කාර්යාලවල සේවය කරන සියලුම සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් විසින් කෘත්‍රිම සිංචනය සඳහා හෝ වෙනත් කවර හෝ ව්‍යාජත්‍ව කටයුත්තක් සඳහා නිරීක්ෂණය කරන ඵලගව සහ මිගව ගොවිපොළවල් ද, ක්ෂේත්‍ර දින පැවැත්වීම සඳහා යොදාගැනෙන සහ අදාළ වන සියලුම ගොවිපොළ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබීම සහ එම ගොවිපොළ සතු සියලුම මී ගවයන් සහ එළ ගවයන්ගේ කන් සලකුණු කර තිබීම අත්‍යාවශ්‍ය වේ. එලෙස කටයුතු කෙරී නොමැති ගොවිපොළක් නම් අදාළ ගොවිපොළ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමටත් එම ගොවිපොළ සතු සියලුම මී ගවයන් සහ එළ ගවයන්ගේ කන් සලකුණු කිරීමටත් කටයුතු කලයුතු වේ.

4) එළ ගවයින් සහ මී ගවයින් ප්‍රවාහනය ,කිරීම සඳහා ගොවීන් විසින් ඕනෑම පශු වෛද්‍ය නිලධාරී කාර්යාලයකට යොමු කරන සියලුම ඉල්ලීම් සඳහා සෞඛ්‍ය සහතික නිකුත් කිරීමට පෙර අදාළ ගවයින් අයිති ගොවිපොළ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබීම සහ එම ගොවිපොළ සතු සියලුම මී ගවයන් සහ එළ ගවයන්ගේ කන් සලකුණු කර තිබීම අත්‍යාවශ්‍ය වේ. එලෙස කටයුතු කෙරී නොමැති ගොවිපොළක් නම් ආරම්භයේදීම අදාළ ගොවිපොළ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමටත් එම ගොවිපොළ සතු සියලුම මී ගවයන් සහ එළ ගවයන්ගේ කන් සලකුණු කිරීමටත් කටයුතු කලයුතු වේ.

5) පශු වෛද්‍ය කාර්යාලවල නඩත්තු කෙරෙන බාහිර ප්‍රතිකාර ලේඛණය, කෘතීම සිංචන ලේඛණය සහ ගොවිපොළ විස්තර ලේඛණගත කරන සෑම ලේඛණයකම අදාළ කරුණ ලේඛණ ගත කරන අවස්ථාවලදී අදාළ සේවාව ලබාගන්නා තැනැත්තාගේ ගොවිපොළ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබීම සහ එම ගොවිපොළ සතු සියලුම මී ගවයන් සහ එළ ගවයන්ගේ කන් සලකුණු කර තිබීම අත්‍යාවශ්‍ය වේ. එලෙස කටයුතු කෙරී නොමැති ගොවිපොළක් නම් ආරම්භයේදීම අදාළ ගොවිපොළ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමටත් එම ගොවිපොළ සතු සියලුම මී ගවයන් සහ එළ ගවයන්ගේ කන් සලකුණු කිරීමටත් කටයුතු කලයුතු වේ.

6) එලෙසම අදාළ මාසය තුල කෙරුන සියලුම එළ ගව සහ මී ගව කන් සලකුණු කිරීම් පිළිබඳව මාසික වාර්තා අනිවාර්යයෙන්ම ප්‍රධාන කාර්යාලයට යොමු කළ යුතුවන අතර අලුතින් ලියාපදිංචි ගොවිපොළ වාර්තාවද ඒ සමග ඉදිරිපත් කලයුතුය.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ (රේඛීය සහ පළාත්) සේවයේ නියුතු යම් නිලධාරියෙක් මෙයට පටහැනිව රාජකාරී කරන්නේ නම් සහ ඔහු හෝ ඇය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතියට අනුකූල නොවන රාජකාරියක නිරතවන්නා සේ සැලකීමටත් එම රාජකාරිය සඳහා වැයවන්නාවූ රාජ්‍ය මුදල් සහ දේපල සම්බන්ධයෙන් ඔවුන් සෘජුවම වගකිව යුතු වන අතර එලෙස කටයුතු කිරීම ඔහු හෝ ඇය වෙත පැවරී ඇති රාජකාරී පැහැර හැරීමක් මෙන්ම රාජකාරී සාරධර්ම වලට පටහැනි විනයානුකූල නොවන ක්‍රියාවකි.

වෛද්‍ය. ඩබ්. කේ. ද සිල්වා
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1) ලේකම්, පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය
2) සියලුම ප්‍රධාන ලේකම්වරුන්
3) පශු සම්පත් විෂය භාර සියලුම පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්
4) අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
5) සියලුම අධ්‍යක්ෂකවරුන් - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
6) සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්